දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின்அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

## பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்

## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/ADM/03/07/2024

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2026.08. 5

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන මුද්‍රිත ලිපිවල පිටපත් සීමා කිරීම.</u>**

මෙම කොමිෂන් සභාවේ විෂය පථයට අදාළ නොවන සහ කොමිෂන් සභාව/ කාර්යාලය විසින් කළ යුතු කාර්යයක් නොමැති ලිපි ලේඛන රාශියක් පිටපත් වශයෙන් දෛනිකව මෙම කාර්යාලය වෙත යොමු වන බව නිරීක්ෂණය වේ.

02. එකී ලිපි සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ මෙම කාර්යාලය දැනුවත්වීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය නොවන බැවින් එම ලිපි පිටපත් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම අනවශ්‍ය ක්‍රියා මාර්ගයක් ලෙස පෙනීයයි. තවද මෙමගින් විශාල සම්පත් නාස්තියක් සහ කාලය අපතේ යාමක් සිදු වන බව ද නිරීක්ෂණය වේ.

03. ඒ අනුව ඉදිරියේදී පහත සඳහන් ලිපි ලේඛන මෙම කාර්යාලය වෙත ඉදිරිපත් නොකරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් ඔබ යටතේ ඇති සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්ද දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

1. නිලධාරීන්ගේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමේ ලිපි පිටපත්
2. නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන ලිපි පිටපත්
3. මෙම කොමිෂන් සභාව මඟින් බලය අභිනියෝජිත බලධරයන් විසින් පත්කරනු ලබන නිලධාරීන්ගේ රාජකාරි භාර ගැනීම්, ස්ථාන මාරු නියෝග පිටපත්, සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීම්/ උසස්කිරීමේ පටිපාටි වලට අන්තර්ග්‍රහණය කරන ලිපි පිටපත්, සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීමේ පටිපාටි/ උසස්කිරීම් පටිපාටි අනුව සිදු කරනු ලබන පත්වීම් ලිපිවල පිටපත්/ උසස්වීම් ලිපිවල පිටපත්

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව